# සංවර්ධන සන්නිවේදනය

**සංවර්ධනය උදෙසා රටක ජනතාවගේ මානසික පසුබිම සකස් කරනු පිණිස ආකල්පමය වෙනස, සහභාගිත්වය යන අපේක්ෂාවන් ඉටුකර ගැනීමට විධිමත් සන්නිවේදන ක්‍රමයක් උපයෝගී කොට ගැනීම සංවර්ධනාත්මක සන්නිවේදනය වශයෙන් හැඳින් වේ.**

රටක සංවර්ධනය නම් තත්ත්වය කරා එළඹීමට අවශ්‍ය සියලුම ක්‍රියාදමයන් අපේක්ෂිත ඉලක්කයන් කරා ගෙන යන්නට මූලික වන්නේ සන්නිවේදනය නම් මෙවලමයි. සංවර්ධනය සඳහා අදාළ වන ජනතා ක්‍රියාකාරිත්වයට, කාර්යක්ෂමතාවයට හා සහභාගිත්වයට එම ජනතාව තුළ කිසියම් වෙනසක් සිදුවිය යුතුය.

**සරත් විජයගුණවර්ධන**
*අලෙවි සහකාර*
**ප්‍රකාශන ඒකකය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

මේ වෙනස ප්‍රධාන වශයෙන් මනෝ මූලික කරුණකි. එනම් මානසික විපර්යාසයකි. එමගින්, සිදුවන්නේ ආකල්පමය වෙනසකි. සිතුම් - පැතුම් හා හැසිරීම් රටාවේ ද වෙනසකි. ජනතා - සිතුම් පැතුම් හා ආකල්ප සුදුසු තත්ත්වයක නොවන විට එය රටක ප්‍රධාන සංවර්ධන බාධකයක් බැව් හඳුනාගෙන තිබේ. පුද්ගල බාධක නම් වූ එම කාරණය තුළ පාරම්පරික බව, කර්මවාදය, පටු ජීවන දැක්ම, ඉදිරි දැක්මකින් තොරවීම, පසුගාමී බව හා මිථ්‍යා විශ්වාස යනා දී කරුණු අඩංගු වේ. සංවර්ධනය සඳහා මෙම බාධක ඉවත්කර ගත යුතු අතර ඒ සඳහා ආකල්පමය වෙනසක අවශ්‍යතාවය සටහන් කළ යුතුය.

මෙම ආකල්පමය වෙනස සඳහා සංවර්ධන ක්‍රියාදමයේ ප්‍රධාන අංගයක් වශයෙන් ඊට අදාළ සන්නිවේදනය උපකාරී වෙයි. එය විධිමත්ව, ක්‍රමවත්ව හා සැලසුම් සහගතව සිදුවිය යුතුය. මෙය මිනිස් මනස ඉලක්ක කොට සිදුවන්නක් හෙයින් හා මානසික සම්බන්ධතාවයක් වන හෙයින් මුළුමනින්ම මනෝ විද්‍යාත්මක විෂය කරුණකි. පුද්ගලයාගේ ආකල්පමය වෙනසක් අවශ්‍යතාවය මෙන්ම සංවර්ධනය පිළිබඳ බොහෝ විග්‍රහයන්හි දී **"සහභාගිත්වය"** නම් වූ කරුණ සම්බන්ධයෙන් ද අවධානය යොමු කරනු ලැබේ. සංවර්ධනයට අදාළ කටයුතු සැලසුම් කිරීමේදීත් ඒවා ක්‍රියාත්මක කිරීමේදීත් ජනතා සහභාගිත්වය අනිවාර්ය බව බලධාරීන්ගේ අවධානයට ලක්ව තිබේ. එසේම, මෙම සහභාගිත්වය, තීරණ ගැනීම, තීරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල ඇගයීම යන සෑම අවස්ථාවකදීම එක ලෙස පැවතිය යුතු ය.

**සහභාගිත්වය සඳහා මූලික වන්නේ කාරණයන් හෝ කටයුත්තක් කෙරෙහි ජනතාව දක්වන පිළිගැනීම හා එකඟතාවයයි.** තීරණ ගැනීමේ වැදගත්ම කාරණය නම් මේ එකඟත්වය. පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීමයි. මේ සඳහා අවශ්‍ය කරුණු අවබෝධ කර ගැනීම සඳහා මූලික දැනුමක් අවශ්‍ය වේ. අදාළ දැනුම ලබාදිය නොහැකි නම් මෙම කර්තව්‍ය ආරම්භයේදීම ප්‍රතික්ෂේප වේ. අවබෝධ කර ගැනීමෙන් පසුව උනන්දුව හා කැමැත්ත ලබා ගත හැකිය. ඒ සමගම කෙරෙන ඇගයීම, මෙම උනන්දුව තහවුරු කරයි. අත්හද බැලීමේ අවස්ථාව හෙවත් ක්‍රියාත්මක තත්ත්වයට අවතීර්ණ වන්නේ ඉන් පසුවය. භාවිතය නම් සඵල වන්නේ ඊට පෙර අවස්ථා සතුටුදායක තත්ත්වයෙන් බද්ධව එකිනෙක එම අවස්ථාවන් කරා පැමිණියේ නම් පමණි. යම් අවස්ථාවක දුර්වලතාවයන් ඇති වුවහොත් අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ ප්‍රතික්ෂේප කිරීමයි. භාවිතය පිළිබඳ කැමැත්ත එකඟතාවය හා ඵලදායිතාවය මත පැවැත්ම තහවුරු කරනු ලබයි. මෙම අවස්ථාව කරා පැමිණෙන තෙක් අඛණ්ඩ සන්නිවේදන ක්‍රියාදමයන් අවශ්‍යයෙන්ම සිදුවිය යුතු බවත්, එය අවස්ථා එකිනෙක බැඳ තබන ශක්තිමත් හුයක් බවට පත් වේ.

ගුවන්විදුලිය, පුවත්පත, රූපවාහිනිය, සිනමාව, ඇතුළු යම් යම් ජනමාධ්‍ය මෙහෙයවමින් යම්කිසි ජනාවාසයක කිසියම් පරිසරයක් සකස්කල හැකි නම් එය වැඩදායක ක්‍රියාදමයක් වේ. මෙම පදනම **"සංවර්ධන සන්නිවේදනය"** යනුවෙන් පුළුල් ලෙස හඳුන්වනු ලැබේ.

සංවර්ධන සන්නිවේදනයේ ප්‍රධානතම අරමුණ වන්නේ රටක සංවර්ධනය උදෙසා

ක්‍රියාත්මක කරනු ලබන සියළු ක්‍රියාදමයන්ගේ ඵල ලැබීමටත් ඊට අවශ්‍ය ජනතා සහභාගිත්වය හා මානසික ආකල්පමය වෙනස ඇතිකිරීම සඳහා හවුල්වීමත් ය. ඒ අනුව, මෙම අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමේ දී සංවර්ධන සන්නිවේදනයෙහි මූලික කාර්ය වන්නේ ඊට අදාළ දැනුම - අවබෝධය ලබාදීමත් අවශ්‍ය උත්තේජනය ඇති කිරීමත් ය.

මෙම සංවර්ධන සන්නිවේදනය, ඉලක්කගත අරමුණක් සඳහා පොළඹවන බැවින් දියුණුයැ යි සලකන රටවල වාණිජ අරමුණු සඳහා අති සාර්ථක අන්දමින් උපයෝගි කර ගනී. එය ආදර්ශ කොට සංවර්ධනය වෙමින් පවතින තෙවන ලෝකයේ රටවල් ද, එම වාණිජ අරමුණු උදෙසා උපයෝගී කරගන්නා නමුත් එය සංවර්ධන ඉලක්කයන් කරා යොදවා ගන්නට ප්‍රමාණවත් උනන්දුවක් දක්වා නොමැත. සංවර්ධනයේ සියළුම අංගෝපාංගයන් පහළ මන්දගාමී තත්ත්වයක තිබිය දී මෙම වාණිජ අරමුණු සඳහා වන පෙළඹවීම හා සන්නිවේදන ක්‍රියාදමයන් වඩාත් ඉස්මතුව උච්ඡතම අවස්ථාවන්ට පත්ව තිබීම දක්නට ලැබේ.

සංවර්ධන සන්නිවේදනය වඩාත් වැදගත් වන්නේ ලොව පිළිගත් සංවර්ධන යොමුවක් ඔස්සේ දේශීය අවශ්‍යතාවයන්ට අනුව සකසා, ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන මූලික ප්‍රශ්න වලට පිළිතුරු සොයා, ඒ සඳහා සන්නිවේදන ක්‍රමෝපායයන් හා ශිල්ප න්‍යායන් භාවිතාකර ගැනීම සඳහාය.

ඒ සමඟම සංවර්ධනය යනු සාමූහික ක්‍රියාකාරිත්වයක් වන බැවින්, ඊට අවශ්‍ය සබැඳියාවන් හා අන්තර් සබඳතා ගොඩනැඟීමත් ඒවා තහවුරු කිරීමත් අඛණ්ඩව පවත්වා ගෙනයාම කෙරෙහි සැලකිලිමත් විය යුතු වේ.

සංවර්ධනය සඳහා **අනුයාත්මක සන්නිවේදනය** හා **උපදේශාත්මක සන්නිවේදනය** උපයෝගි කර ගනිමින් ග්‍රාහකයා වෙත පණිවුඩ සන්නිවේදනය කිරීමේ දී **මහාචාර්ය විල්බර් ශ්‍රාම්** පෙන්වා දෙන්නේ සාර්ථක මානසික ගනුදෙනුවක් සිදුවිය යුතුය යන්නයි. සන්නිවේදකයාගේත් ග්‍රාහකයාගේත් මනෝ වෘත්තීන් ගැලපීමක් ඇති විය යුතුය.

නිර්මාණාත්මක සන්නිවේදන මාධ්‍යයන් සංවර්ධන කාර්යයෙහිලා ඉවහල් කරගැනීම පිළිබඳව බොහෝ පර්යේෂණ හා අත්හදා බැලීම් සිදුකර තිබේ. නිර්මාණාත්මක සන්නිවේදනය මාධ්‍යයක් වශයෙන් ගත හැක්කේ කලා, සංස්කෘති හා සාහිත්‍ය වශයෙනි. රටක ජාතික සංවර්ධන කාර්යයේ -දී මෙවන් නිර්මාණාත්මක සන්නිවේදනයන් ගෙන් ලබාගත හැකි පිටුවහල ඉමහත් වේ. පුද්ගලාන්තර සන්නිවේදනය මගින් ද, ජනතාවගේ ප්‍රතිචාර නිදහසේ කඩිනමින් ඉහළට ගලා එන්නට පාඨක සමාජ, තරුණ ගොවි සමාජ, ගුවන්විදුලි අසන්නන්ගේ සමාජ, රූපවාහිනී විමසුම්, ප්‍රේක්ෂක සමාජ එකතු, සංවාද මණ්ඩප යනාදිය මගින් උපකාරී වේ.

ජාතික සංවර්ධනය නංවාලන අන්දමට හැඩ ගැස්වීම ජාතික සංවර්ධන උපාය මාර්ගවල ප්‍රමුඛත්වය ගත යුතු සංකල්පයක් විය යුතු වේ. මේ නිසා, සංවර්ධනයෙහිලා මානව විභව ශක්ති සංවර්ධනයට විශේෂ අවධානය යොමු කොට නිද්‍රාශීලී කොට, නිර්වින්දනය කොට සිටින පුද්ගලයන් අවදිකොට, ප්‍රාණවත් කොට ජාතික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධකර ගැනීම මාධ්‍යයේ වගකීමකි.

## ගොවි ජනතා

**"ගොවි ජනතා"** සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සළකමු. එසේම, ඒවා ඉදිරි කලාපයන් හි පළ කිරීමට ද කටයුතු කරනු ලැබේ. එබැවින්, එවැනි ද, සංස්කාරක වෙත පහත සඳහන් ලිපිනයට යොමු කළ හැකිය.

**සංස්කාරක**
**ගොවි ජනතා**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**114, විජේරාම මාවත,**
**කොළඹ - 07.**

**දුරකතනය : 2696981, 2698539-41**